
sinhalaebooks.com



sinhalaebooks.com



ඒ ශීත සෘතුවේ අවසාන කාළයයි. ඒවන විට මාගේ බිරිඳගේ වියෝව සිදුවී අවුරුදු 2ක් පමණ ගතවී තිබුණි. එම නිසා මා වැඩි කාළයක් බේකර් වීථියේ ගතකළෙමි. හෝම්ස් නම් එලෙසමය. ලන්ඩනයේ අපරාධකරුවන් සිටින්නට ඔහුට නම් පරීක්ෂණ වලින් නම් ගැලවීමක් නැති බව අමුතුවෙන් කිවයුතු නොවේ.

එක්තරා දිනක සුපුරුදු පරිදි මා හෝම්ස් හමුවීමට ගියෙමි. නමුත් ඔහු බැහැරට ගොස් ඇති බැව් හඩ්සන් මහත්මිය ප්‍රකාශ කළ නිසාවෙන් මා හෝම්ස් සිටි කාමරයට ගොස් අසුන්ගෙන ඩේලිමේල් පුවත්පත අතට ගත්තෙමි. මොහොතක් ගතවිය.

හෝම්ස් පැමිණියේය.

ඔහ්.. වොට්සන්… සුබ දවසක්… ඉතිං කොහොමද මිත්‍රයා…

වරදක් නෑ ඉතිං… ඩිස්පෙන්සරියෙ හිරවෙලා ඉන්නවා… මා කීවෙමි.

ඒක ගැන එච්චර හිතන්න එපා මිත්‍රයා… ඔබ වැන්නෙක් වීම එච්චර ලෙහෙසි පහසු දෙයක් නෙවෙයි එහෙම නේද? හෝම්ස් කීවේ අසුනේ හරිබරි ගැසෙමිනි.

ඔව් ඔව් ඒ කථාව නම් හරි තමයි… ඒත් දොස්තර කෙනෙක් නොවෙන එකම තමයි ගොඩක් හොඳ… ලෙඩ්ඩුන්ටම හිරවෙලා ඉන්නෙ මම… මා කීවෙමි.

ගණන් ගන්න එපා වොට්සන්… මේ මමත් ඉන්නෙ හිරවෙලා…

ලෙඩ්ඩුන්ට…

නෑ නෑ ඩීමන්ස්ලට….

මොකක්ද ඒ කතාවෙ තේරුම… ඔබ කොහොමද යක්ෂයින්ට හිරවෙලා ඉන්නේ… ඔබ හරි නම් හිරවෙන්න ඕන අර මොරියාටි වගේ දරුණු ගණයේ අපරාධකරුවන්ටනේ…

ඒත් වොට්සන් ඔබට ඩ්‍රැකියුලා මතකයි නේද?

ඔව් ඒ හුඟක් කාලයකට කලින්නේ…

ඒත් මට ඒ හා සමාන පරීක්ෂණයක් ලැබිල තියෙනවා…

ඇයි මොකක්ද වෙලා තියෙන්නෙ…

හෝම්ස් නැගිට්ටේය. මේසය මත තිබූ රෝල් කරන ලද පෝස්ටරයක් ගත් ඔහු එය මට පෙන්විය.

මේ වීජා පුවරුවක් (Ouija board) නේද ?

ඔව් වොට්සන්… මට දැන් සිද්ධ වෙලා තියෙන්නෙ සේරම මේ පුවරුවෙන් විසඳගන්න.

ඉස්සර වෙලාම කියන්න හෝම්ස් ඔබ ඕක විශ්වාස කරනවද?

ඒක නෙවෙයි වොට්සන් මෙතන තියෙන ප්‍රශ්නය. හතර දෙනෙක් ඉස්සරහ මේක පාවිච්චි කරපු කෙනෙක් එක්වරම අතුරුදන් වුණේ කොහොමද ?...

හෝම්ස් කීවේ ඇස් ලොකු කරමිනි.

මොකක්ද ඒ කතාවේ තේරුම හෝම්ස්…

sinhalaebooks.com



බටහිර ලන්ඩනයේ සිල්වර් මාවතේ ඉන්න රෝවර් මහත්මයාගෙ ගෙදර ඔහුගේ පුතයි තවත් යාළුවෝ හතර දෙනෙක් මේක පාවිච්චි කරමින් ඉඳල තියෙනවා... පෙරේදා රාත්‍රී 10ට පමණ...

ඉතිං...

ඉතිං රාත්‍රී 12ට පමණ රෝවර් මහත්මයා යාළුවෝ ටික හිටිය තමන්ගේ පුතාගෙ කාමරයට ගිහින් තියෙනවා අහම්බෙන් වගේ... ඉතිං ඔහු දැකල තියෙන්නෙ තමන්ගේ පුතා හැරෙන්නට අනිත් අය සේරම තැන් තැන් වල වැටිල ඉන්නවා...

එතකොට රෝවර් මහත්මයාගේ පුතා...

ඔහු අදටත් ආගිය අතක් නෑ වොට්සන්...

හරි අමුතු සිද්ධියක්නේ...

ඔව්... ඔබ දන්නවා නේද වොට්සන් මේ පුවරුව පාවිච්චි කරන හැටි...

ඔව්... මං වීජා පුවරුවක් භාවිත කරල තියෙනවා හෝම්ස්...

බොහොම හොඳයි... ඒක පාවිච්චි කරන කොට අවසානයටම කරන්න ඕන බොහොම වැදගත් කොටසක් තියෙනවා... ඒක මතකද?

අපොයි ඔව් හෝම්ස්... ගෙන්වාගත්ත ආත්මයට ගුඩ් බායි කියන්න ඕන අනිවාර්යයෙන්ම...

විශිෂ්ඨයි වොට්සන්... අන්න හරි... ඉතිං ඒක කරන්නෙ කොහොමද ?

ප්ලෑංචෙට්ටුව පුවරුවේ Good Bye කියලා සටහන් කරල තියෙන තැනට යවනවා... එහෙම නේද ? මා ඇසුවෙමි.

ඔව්... මේ ළමයි ටික සේරම හොඳට කරන්න ඇති වොට්සන් ඒත් මට තියෙන ගැටලුව තමයි...

ඔහු වීජා පුවරුව ඡායාරූප ගතකරන ලද පෝස්ටරය නැවත දිගහැරියේය.

ඉතිං ඔබ ඉතුරුවෙලා ඉන්න යාළුවන්ගෙන් මොකද වුණේ කියලා ඇහැව්වෙ නැද්ද ?

කනගාටුයි වොට්සන්... වෛද්‍ය විද්‍යාත්මකව පැහැදිලි කරන්න බැරි විදියේ කටහඬ අහිමි හා සිහිමද තත්වයකට ඔවුන් පත්වෙලා... හෝම්ස් කීවේය.

මොනවා...? ඔබ කියන්නෙ මේක භූත ආත්මයක් විසින් කරපු දෙයක් කියලද?

මට තවම එහෙම කියන්න අමාරුයි වොට්සන්... ඒත් බලන්න මේ වීජා පුවරුව දිහා... ඔහු මට පෝස්ටරය නැවතත් මට දුන්නේය.

ම්ම්ම්... මොකක්ද මේක තියෙන වෙනස... මා කිසිදු වෙනසක් නොදුටු නිසාවෙන් ඒ පිළිබඳව විමසුවෙමි.

හොඳින් බලන්න වොට්සන්... හෝම්ස් නැවත කීවේය.

මා නැවත වතාවක් එය පරික්ෂා කිරීමට අතට ගත්තෙමි.

මා බියෙන් සලිතව ගියේ එවිටය.

වීජා පුවරුවක් සඳහා අත්‍යාවශ්‍යම කොටසක් එහි සටහන් කර නොතිබිණි.

හො..හෝම්ස් මේකේ Good Bye කියලා එකක් නැනෙ... මට ගොතගැසුණි.

අන්න ඒක තමයි වොට්සන්... ඕකෙ ගුඩ් බායි නෑ... හෝම්ස් කීය.

sinhalaebooks.com



ඉතිං හෝම්ස්...

නෑ ප්‍රශ්න ඇති... අපි යමු රෝවර් මහතාගේ නිවසට... ඇත්තෙන්ම කිව්වොත් මමත් තවම එහෙට ගියේ නෑ... මේ ඡායාරූපය දීල ගියේ රෝවර් මහත්මයා...

ලන්ඩන් නගරයේම රෝවර් මහතාගේ නිවස පිහිටා තිබීම නිසා පහසුවෙන්ම එහි පිවිසීමට අපට හැකිවිය.

ආ... හෝම්ස් මහත්මයා... ඔබ ආ එක ගොඩක් හොඳයි... ඔහු දුක්බරව සිටි අයුරු මා හොඳින්ම දුටුවෙමි.

මේ මගේ මිත්‍රයා... දොස්තර වොට්සන්...

හඳුනාගැනීම සතුටක්...

ඔහු මට ආචාර කළේය.

අපි යමුද කාමරයට... හෝම්ස් කීය.

අනිවාර්යයෙන්ම මහත්මයා... රෝවර් කීය.

ඒ යන අතුරතුරද හෝම්ස් නිහඬව නොසිටියේය.

රෝවර් මහත්මයා... ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියෙන් කවුරුත් ආවද?

ඔව්... ලෙස්ට්‍රේඩ් පැමිණ පරික්ෂා කර ගියා...

ඔහු මොනවද වීජා පුවරුව සහ ඔබේ පුත්‍රයා ගැන කිව්වේ... හෝම්ස් ඇසුවේය.

ඔහු කියනවා කොහේ හරි ගිහින් ඇතිලු... ඔහු හරියට ඒක කිව්වේ මගේ පුතා අනාචාරයේ ගියා වගේ... ඔහු කනගාටුවෙන් ප්‍රකාශ කළේය.

එතකොට පුවරුව...

ඒ ගැන ඔහු කුමක්වත් කිව්වෙ නෑ හෝම්ස් මහත්මයා...

අප උඩුමහලේ රෝවර්ගේ පුත්‍රයාගේ කාමරයට ගියෙමු.

ඔහුගේ නම... අවුරුදු 20ක පමණ පෙනුමක් සහිත ඔහුගේ ඡායාරූපයක් දුටු මට ඔහුගේ නම දැනගැනීමට අවැසි විය.

ජැක් රෝවර්...

හෝම්ස් කාමරය පරික්ෂා කර බැලුවේය. සැබැවින්ම කිවහොත් එය වචන දෙක තුනකින් ප්‍රකාශ කළ හැකිවුවද එයට පැය එකහමාරක් පමණ ගතවිය.

ඉන්පසු ඔහු අතට ගත්තේ වීජා පුවරුවයි. එයද ඔහු ඉතාම සියුම් ලෙස පරික්ෂා කළේය.

මේක කොහෙන්ද රෝවර් මහත්මයා...

ඔය පුවරුව බොහොම පරණයි... මමත් සෙල්ලම් කරල තියෙනවා... ළඟදී තමයි පුතාත් යාලුවොත් මේක පාවිච්චි කරන්න ගත්තේ...

පෙර දැක්වූ ලෙසම එහි ගුඩ් බායි යන්න සටහන්ව නොතිබිණ.

කළිනුත් මේකෙ ගුඩ් බායි කියලා තිබුණේ නැද්ද මහත්මයා... හෝම්ස් ඇසීය.

මට එතරම් මතකයක් නෑ හෝම්ස් මහත්මයා... තියෙන්න නැතුව ඇති... ඒකනේ ඕකෙ නැත්තේ...

හෝම්ස් එය පරික්ෂා කර අවසන් කළේය.

sinhalaebooks.com



මහත්මයා... කුමක් හෝ සොයා ගැනීමට හැකිවූවාද? රෝවර් බලාපොරොත්තු සහගතව විමසීය.

නැහැ මහත්මයා... කිසිවක් නෑ... හෝම්ස් සුසුමක් පිටකරමින් කීය.

ඒ කියන්නෙ මගේ පුතාට වුණේ මොකක්ද කියලා හොයාගන්න බැරිවේවිද?

මට හිතෙන්නෙ මේක භෞතිකව විසඳීමට බැරි හැඩයි.

ඒ කිව්වෙ හෝම්ස්... මා ඇසුවෙමි.

මේ ගැටලුවේ කුමක් හෝ අභෞතික යමක් තිබෙනවා වොට්සන්. කොටින්ම කිව්වොත් මේ පුවරුවට අදාළ ප්ලැංචෙට්ටුවත් මේ කාමරයේ නෑ... හෝම්ස් කීය.

ඉතිං ඔබ එමගින්ද තීරණය කළේ එය... මා ඇසුවෙමි.

නෑ වොට්සන්... මේ වීජා පුවරුවේ Good Bye කියන එක ඕනෑකමින්ම කවුරු හරි මකලා හෝ මැකිලා...

මැකිලා...? ඒ කිව්වෙ මහත්මයා... රෝවර් ඇසීය.

හෝම්ස් අඩි කිහිපයක් අපට ඈතින් ගොස් නැවතුනේය.

අමනුෂ්‍යයන් ගැන ඔබ අසා තිබෙනවාද රෝවර් මහත්මයා... ඔහු අපට පිටුපා සිටම කීය.

අමනුෂ්‍යයින්... රෝවර් බියෙන් සලිතව ගිය අයුරු මා හොඳින්ම දුටුවෙමි.

සැබැවින්ම මාද එවේලේ තැති නොගත්තා නොවේ. මන්ද හෝම්ස්ට යම් කිසි ගැටලුවක ඇතුළාන්තය හොඳින් පෙනෙන විචක්ෂණ බුද්ධියක් ඇති බව ඔබට අමුතුවෙන් කිවයුතු නොවේ.

ඩ්‍රැකියුලා සමඟ ෂර්ලොක් එයට හොඳම උදාහරණයකි.

හෝම්ස්... ඔබ කියන්නේ... මෙතන යක්ෂයින්(ඩීමන්ස්) සම්බන්ධව තිබෙනවා කියලද?

ඉන්න වොට්සන් තාම ඒක අපි තීරණය කරන්න නරකයි... රෝවර් මහත්මයා... මේ වීජා පුවරුව, ඔබ කිව්වා පරණ එකක්ය කියා... හෝම්ස් ඇසීය.

ඔව්... ඒක හරි... රෝවර් කීය.

මේ ගැන තව කවුද දන්නේ... ඔබේ බිරිඳත් මියගිහින් නිසා මං අහන්නේ... හෝම්ස් ඇසීය.

මේ පුවරුව මහත්මයා හුඟක් පරණයි, මගේ මව පවා මේක පාවිච්චි කරල ඇති...

කෝ ඔබේ මව...

ඇය ජීවත්ව සිටිනවා... රෝවර් කීය.

හරි එහෙනම් අපට පුලුවන් ඇගෙන් අහන්න...

කනගාටුයි මහත්මයා... ඇය සිටින්නේ විම්බල්ඩන් මානසික රෝහලේ... රෝවර් කනගාටුවෙන් මෙන් කීය.

ඔහෝ... ඒකත් එහෙමද?... කමක් නෑ මට වාට්ටු අංකයයි නමයි දෙන්න... හෝම්ස් කීය.

හෝම්ස් මානසික රෝගියෙකු සමඟ මේ සිදුකරන්නට යන ගනුදෙනුව කුමක්ද යන්න තේරුම් ගැනීමට නොහැකිව මා ලතවුණෙමි.

සිල්වියා රොලින්, අංක 33...

sinhalaebooks.com



හොඳයි එහෙනම්... අපි මේ වීජා පුවරුව රැගෙන යනවා... හෝම්ස් එය රැගෙන බෑගයකට දමාගත්තේය.

මගේ සිතේ පැනනැගී තිබුණු වකිතය වැඩිවූයේ එවිටය.

සියලු කාරණා සඳහා මේ වීජා පුවරුව හේතුවක් වූයේ නම්, Good Bye යන්න පෙර සඳහන්ව තිබී එය අමනුෂ්‍ය හේතුවක් නිසා මැකී ගියේ නම් සැබැවින්ම අප මේ පුවරුව රැගෙන යාම නුවණට හුරු නොවන බව මට හැඟිණි.

නමුත් ඒ සියල්ල මට වැටහී අවසන් වන විට අප සිටියේ හඩ්සන් මහත්මියගේ නිවස ඉදිරිපිටයි.

වොට්සන්, මොනවද ඔපමණ කල්පනා කරන්නේ... යමු ඇතුලට... හෝම්ස් මා පියවි සිහියට රැගෙන ආවේය.

හෝම්ස්ගේ දෑතෙහි වීජා පුවරුව සහිත බෑගය තිබේ. එහි අර්ථය වීජා පුවරුව අප අසල බවයි. එසේ නම් ඉදිරිය නිසැකයෙන්ම ගැටලු රාශියක උත්පත්තියකි.

මේ මොහොතේ එවැනි කිසිදු දෙයක් සිදුනොවේ යැයි කිවහැක්කේ කාටද ?

වීජා පුවරුව රැගෙන ඒම පිළිබඳව නම් මා සිටියේ එතරම් සතුටින් නොවේ.

ඔව්... මං දන්නවා වොට්සන් ඔබ අනුමත කරන්නෙ නෑ මං වීජා පුවරුව රැගෙන ඒම...

මං ඒක ඔබට හවස හෙමින් සීරුවේ පැහැදිලි කරල දෙන්නම් මිත්‍රයා... ඒත් ඊට කළින්...

ඊට කළින්...? මා ඇසුවෙමි.

ඊට කළින් මට පුංචි ගමනක් තිබෙනවා... මා ඉක්මනින් එන්නම්... හඩ්සන් මහත්මියගේ කෝපි ස්වල්පය මේ එළැඹෙන්නට තියෙන හැන්දෑවේ තොලගාන එක මං කොහොමටවත් අතපසු කරගන්නෙ නෑ වොට්සන්... සිනාබර මුහුණින් හිස්වැස්ම පැළඳගත් ඔහු ක්ෂණයකින් නික්ම ගියේය.

වීජා පුවරුව කාමරයේ ඇත. කුමන හේතුවක් නිසාද යන්න අපැහැදිලි වකිතයක් මාගේ සිත වෙළාගෙන තිබුණි. එහෙයින් මා පහළට බැස වීථිය අයිනට ගියෙමි.

එදින සවස කෝපි පානය අතරතුර නැවතත් ගැටලුව කෙරෙහි අප අවධානය යොමු කළෙමු.

හෝම්ස් ඔබ ඇයි වීජා පුවරුව මෙහි ගෙනාවේ...

ඈත තිබෙන වස්තුවක් පිළිබඳව ගවේෂණය කිරීමට වඩා ඒක ළඟ තියෙනවා නම්...

ඔව් ඔව් හෝම්ස් හරි මට තේරෙනවා... ඒත් මේකෙ ඔබ කියන්නා වාගෙ අභෞතික, අමනුෂ්‍ය හෝ ඩීමන්ස්ලාගේ සම්බන්ධයක් තියෙනවා නම් අපි ඒක මොන එහෙකටද මේ කාමරයට රැගෙන එන්නේ... මා ව්‍යාකූලත්වයට පත් වූ නිසාවෙන් විමසුවෙමි.

වොට්සන්... මගේ මිත්‍රයා... මේ කතාව අපිට තේරෙන්නෙ අපි මේක ළඟ හිටියොත් විතරයි... කොටින්ම අපි මේක...

මා ඔහුට සම්පූර්ණ කිරීමට ඉඩ නොදුන්නෙමි.

හෝම්ස්... ළමයෙක් අතුරුදන් කරවපු, තවත් ළමයි පිරිසක් වෛද්‍ය විද්‍යාත්මකව පැහැදිලි කරන්න බැරි තත්වයකට පත් කරවපු වීජා ලෑල්ලක් ළඟ තියාගෙන බල බලා ගැටලුව ගැන සිතීමද ඔබ ඔය ඉදිරියට කරන්න හිතාගෙන ඉන්නේ... මා විමසුවෙමි.

නෑ වොට්සන්... පැහැදිලිවම නෑ... ඊට වඩා දෙයක් කරන්නයි මං ලෑල්ල මෙහෙට ගෙනාවේ...

ඊට වඩා ඒකෙ මොකක් කරන්නද?... මා කිසිවක් සිතාගත නොහැකිව විමසුවෙමි.

හෝම්ස් කබා සාක්කුවෙන් යමක් පිටතට ගෙන ටීපෝව මත තැබුවේය. සැබැවින්ම එය හරිහැටි දුටුවේ එවිටය. ඒ ප්ලැංචෙට්ටුවකි.

sinhalaebooks.com



අප ඒක ක්‍රීඩා කළ යුතුයි...

මොකක්ද? මොකක්ද ඔබ කිව්වේ...

මං හිතන්නෙ මං කිව්ව එක ඔබට පැහැදිලිවම ඇසුණා... හෝම්ස් කීවේය.

අපි ඒක ක්‍රීඩා කරන්න ඕනි...? මොනවා...? මා ගල් ගැසී හෝම්ස් දෙස බලාසිටියෙමි.

මේක අපි ක්‍රීඩා කරන්න ඕන... අද රෑට... හෝම්ස් අවධාරණය කළේය.

මොනවා... ඒත් ඇයි..?

ඒක තමයි ජැක් හොයාගන්න තියෙන එකම ක්‍රමය... හෝම්ස් කීවේය.

හෝම්ස් ඩේලි මේල් පුවත්පත අතට ගෙන කියවන්නට පටන් ගත් අතර මා ඔහුගේ ස්ක්‍රැප් පොත අතට ගෙන එය නැරඹුවෙමි.

පැය කිහිපයක් ගතවිය.

හෝම්ස් මහත්මයා... හඩ්සන් මහත්මිය දොරකඩ සිට ඇමතුවාය.

එන්න හඩ්සන් මහත්මිය... හෝම්ස් නැගිටගොස් දොර විවෘත කළේය.

මහත්මයා... මේ ඔබේත් දොස්තර මහත්මයාගේත් රෑ කෑම වේල... ඇය කීවේ හෝම්ස් අතට බන්දේසියක් දෙමිනි.

බොහොම ස්තුතියි... කී හෝම්ස් දොර වැසුවේ ඇය පිටත්ව ගිය පසුවය.

වොට්සන්... පාන් පෙත්තක් බිත්තර ඔම්ලට් එක්ක... ඔබට ඒවා රුචියි... එහෙම නේද?

ඔව්... පැහැදිලිවම... මා කීවේය.

අප දෙදෙනාම රාත්‍රී ආහාරය ගත් අතර එය සිදුවී හෝරාවක් යාමටත් මත්තෙන් හෝම්ස් වීජා පුවරුව තිබූ බෑගය විවෘත කොට එය පිටතට ගත්තේය.

වොට්සන්... මේ ඉටිපහන් හතරම මේ මේසය හතර කොනේ තියලා පත්තු කරන්න...

ඔහුගේත් මගේත් ආසන දෙකට මැද්දෙන් වන්නට කාමරයේ තිබූ එතරම් උස නොමැති කුඩා මේසය කිවූ පරිදි මා සකස් කළෙමි.

ඒ අතිභයංකාර වූ ක්‍රීඩාවට දැන් නම් සියල්ල සූදානම්ය.

හෝම්ස් මට මුහුණලා වාඩිවිය.

වොට්සන්... අපි මේක කරමු... කිසිදු ලෙසකින් මොනයම් හෝ ආකාරයේ දෙයකට කලබල වෙන්න නම් එපා...

ඒත් හෝම්ස්... අපි මේ කරන්න යන්නෙ දැන දැන අනතුරට වැටීමක්... බලන්න මේකෙ Goodbye කියලා නෑ... අපි කොහොමද ආත්මයන්ට සමුදෙන්නේ..?

ඒක තමයි වොට්සන් මේකෙ තියෙන සුවිශේෂීභාවය... හෝම්ස් කීවේය.

ඔහු ඉටිපහන් දැල්වීය. ප්ලෑංචෙට්ටුව පුවරුවේ හරි මැදින් තැබූ ඔහු එය මත මාගේ අතද තබන ලෙස ඔහු විධාන දුන්නේය.

ඝන අන්ධකාරයේ ගිලී පවතින බලසම්පන්න ආත්මයන් හට මාගේ මේ ඇමතීම ඇසෙත්වා... රළුවූ හෝ සියුමුවූ තැන්හී ගැවසෙන ආත්මයන් මෙය අසත්වා... හෝම්ස් අමුතුම කටහඬක් යොදාගෙන කීවේය.

එවිටම එක් ඉටිපන්දමක් නිවීගියේය. හෝම්ස් එය නැවත දැල්වීමට සූදානම් විය.

sinhalaebooks.com



ඒ සමඟ දූටු දෙයින් මා බියෙන් සලිතව ගියෙමි.

මොහොතකට පෙර වීජා පුවරුවේ නොතිබුණු Goodbye සටහන, මැකී නොතිබුණාක් මෙන් පැහැදිලිවම සටහන්වී තිබුණි.

හෝම්ස්... හෝම්ස් බලන්න මේක...

මා Good Bye සටහන හෝම්ස්ට පෙන්වූයෙමි.

ඔව්... වොට්සන්... අපට දැන් පුලුවන් වේවි ඔවුන්ගේ අදහස දැනගන්න.

ඔවුන්ගේ..?

ජැක්ගේ අතුරුදන් වීම, ළමුන් සිහිවිකල් වීම මේ හැමදේකටම ඔවුන් පිළිතුරු දේවි වොට්සන්...

හෝම්ස් කීය.

ප්ලැංචෙට්ටුව එලෙසමය... එය කිසිදු චලනයක් රහිතව නිශ්චලව වීජා පුවරුව මත තිබුණි.

ඒත් අදහස් දැනගන්න නම් මේක චලිත වෙලා ඉංග්‍රීසි අකුරක් ළඟ නතර වෙන්න ඕන... එහෙම නේද හෝම්ස්...

මා විමසුවෙමි.

ඔව් ඒක එහෙම තමයි... දැන් ඔය පොතේ ඔබ ලියන්නට සූදානම් වෙලා ඉන්න... මං ඒක ආරම්භ කරන්නම්...

එසේ කී හෝම්ස් ප්ලැංචෙට්ටුව අතහැරියේය.

ඒත් ඔබ... මා කියන්නට යනවිටම හෝම්ස් අත් මිටමොළවා උඩට දිගුකර මෙසේ පැවසුවේය.

සාක්ෂිකරුවන් පිළිතුරු දෙත්වා...

ස්වයංක්‍රීයව ප්ලැංචෙට්ටුව චලනය වීමට පටන් ගත්තේය. එය ඉතාමත් වේගයෙන් පුවරුව මත චලනය විය.

ඉංග්‍රීසි හෝඩියේ අකුරක් අකුරක් පාසා නැවතෙමින් වේගයෙන් එය චලිත විය.

පුවරුව දෙස ඇස් යොමාගෙන මා අසල තිබූ පොතෙහි එම අදාළ ඉංග්‍රීසි අකුරු සටහන් කරගත්තෙමි.

ප්ලැංචෙට්ටුව අකුරු හතක් දර්ශනය කර Goodbye සටහන මත නතරවිය.

හෝම්ස් මා දෙස බැලුවේය.

වොට්සන් කුමක්ද ඔවුන් කිව්වේ...

මා පොතේ ලියූ අකුරු නොබලාම ඔහුට පෙන්වූයේය.

එය ගත් හෝම්ස් එය කියවා මහ හඬින් කෑගැසුවේය.

මා එනවා...

හෝම්ස් මොකද ඔවුන් ඔබට කියලා තියෙන්නෙ...

ඔහු මට පොත පෙන්වීය.

මා එහි සටහන් කර තිබුණේ "KILL YOU" යන්නයි.

sinhalaebooks.com



ඔහ්... දෙයියනේ... මට කෑගැසිණ.

එය එසේ වුවද හෝම්ස් සිනාසුනේ මා පුදුමයට පත් කරමිනි.

හෝම්ස්... ඒ පණිවිඩය... ඉතාම දරුණුයි... සුළුවෙන් තකන්න එපා... මා කීවෙමි.

සුළුවෙන් තකන්න හොඳ නෑ තමයි වොට්සන්... ඒත් මට වෙන්න උවමනා වෙලා තිබුණෙත් මේකම තමයි... හෝම්ස් කීය.

මොනවා... ඔබට අවශ්‍ය වෙලා තියෙන්නෙ අමනුෂ්‍යයෙක් ගෙන් මැරුම් කන්නද?

බාගවෙලාවට එහෙම වෙන්නත් පුලුවනි... හෝම්ස් කීවේ සැහැල්ලුවෙන් නැගිටිමිනි.

ක්‍රීඩාව එතැනින් නිමා විය.

චකිතය මුසු භීතියෙන් මා නින්දට ගියේ ඉන්පසුවය.

* * *

මා උදෑසන නැගිටින විට හෝම්ස් නවාතැනෙන් බැහැරට ගිය බව හඩ්සන් මහත්මිය මා හට කීවාය.

හුඟක් වෙලාද ඔහු ගිහින්..?

නෑ වොට්සන් මහත්මයා... ඔහු ගිහින් මිනිත්තු දහයකට වැඩි නැහැ... ඔහු කිව්වා ඔබට ඩිස්පෙන්සරියට යන්න කලින් ඔහු එනතෙක් රැඳී ඉන්න කියලා... ඇය කීවාය.

ටික වේලාවකින් හෝම්ස් පැමිණියේය.

සමාවෙන්න වොට්සන් ඩිස්පෙන්සරියට යන්න බාධා කරාට...

ඒක නෙවෙයි ගැටලුව හෝම්ස්... ඔබ කොහෙද ගියේ..?

මං ගියේ වොරන් සාමි මුණගැහෙන්න...

ඔබ කියන්නෙ අර ගුප්ත පර්යේෂණ පිළිබඳ...

ඔව් ඔව් වොට්සන් ඒ මහාචාර්යවරයා තමයි...

මහාචාර්ය..? ඔහු මහාචාර්ය කෙනෙක්ද?

ඔව් වොට්සන්... ඔහු ඩර්හැම් විශ්වවිද්‍යාලයේ ගුප්ත විද්‍යා ශාස්ත්‍රය පිළිබඳ මහාචාර්යවරයෙක්...

හැබෑට... ඉතිං ඔබ ඔහුත් මේකට සම්බන්ධ කරගත්තාද?

ඇත්තවශයෙන්ම කිව්වොත් ඒකට මට ඔව් කියන්න පුලුවන්... හෝම්ස් කීවේ සෝෆාවේ හේත්තු වෙමිනි.

ඔහු මොනවද ඔබට කිව්වේ...

ඔහු කිව්වා මට සමාදානයෙන් සැතපෙන්න හැකිවෙයි කියලා... හරියටම ඔබ කිව්වා වගේ...

මොකක්ද මං කිව්වේ..?

අමනුෂ්‍යයෙක්ගෙන් මැරුම් කන්න...

වොරන් සාමි හිතනවද මේ විදියට ඔබට මේ ගැටලුව විසඳන්න පුලුවන් වෙයි කියලා... මා ඇසුවෙමි.

sinhalaebooks.com



ඇත්තටම වොට්සන්... මේක මේ විදියට කරන්න කිව්වෙත් වොරන් සාමි තමයි... ඔහු කියන විදියට මේක ආත්මයක් විසින් අපි වගේ ප්‍රකෘති ජීවීන් ග්‍රහණයට ගෙන යෑපීමක් සිද්ධ වෙලා තිබෙනවාලු... හෝම්ස් කීවේ පයිප්පයට දුම්කොළ පුරවමිනි.

එක් යම්කිසි ආත්මයක් ජැක්ගේ ජීවිතය රැගෙන ගිහින් කියන එකද ඔහු කියන්නේ... මා ඇසුවෙමි.

ඔව් වොට්සන්... එහෙම තමයි...

ඉතිං අපි කොහොමද නැවත ජැක් ගෙන්වා ගන්නේ...

ඔහු කියනවා වොට්සන්, මේ වීජා පුවරුව හා සම්බන්ධයක් මේ ආත්මය හා තිබෙන්නට පුලුවන්ලු...

ඒ කියන්නෙ මේක විසඳන්න පුලුවන් එකම මාර්ගය මේ වීජා පුවරුව කියන එකද?

පැහැදිලිවම වොට්සන්... ඒක තමයි මාර්ගය...

ඉතිං ඔබේ ඊළඟ පියවර මොකක්ද ?

සිල්වියා රොලින් අප මුණගැසිය යුතුයි වොට්සන්...

අර මානසික රෝගයකින් පෙළෙන කාන්තාව..? ඇයගෙන් කොහොමද යමක් දැනගන්නේ... ඇය මානසික රෝගියෙක්...

ඔව් ඒක හැබැව... නමුත් අපිට තිබෙන අවසන් තුරුම්පුව ඇය නම්..?

ඒත්...

මානසික රෝගී කතාව පැත්තකින් තියන්න වොට්සන්... කොටින්ම මේ කතාව අපි කාට හරි කිව්වොත් ඔවුනුත් අපිව කුදලාගෙන ගිහින් විම්බල්ඩන් මානසික වාට්ටුවකට දාන්න බැරි නෑ... හෝම්ස් සිනාසුනි.

ඔබ කරන්න යන දේ ගැන මට ඒ තරම් පැහැදීමක් නෑ හෝම්ස්... මා කීවෙමි.

ඔව්... ඒක මට තේරෙනවා මිත්‍රයා... ඒකට හේතුව තමයි මේ ගැටලුවේ තිබෙන අභෞතික තත්වය... මා විසඳූ සියල්ලම පාහේ භෞතික තත්වයන් මත පදනම් වුණු ඒවා... වැඩකට නැති කාමරයේ එල්ලා තිබුණු පටිය, ඔබට මතක ඇති වොට්සන් ඒක අන්තිමට මොකටද යොදාගෙන තිබුණේ කියලා...

තිත් වැටුණු පටිය... මා මතකය අවදි කළෙමි.

ඔව්... ඒක ඒ භයානක සර්පයාගේ ගමන් මාර්ගය වුණා... ඒත් මේක..? කාමරයේ හිටපු ජැක් රෝවර් ආගිය අතක් නෑ... යාළුවන්ට මොකක්ද වුණේ කියලා වෛද්‍යවරයෙක්ටවත් පැහැදිලි කරන්න බෑ... ඒ මදිවට Goodbye නැතිවෙලා ඇතිවෙන වීජා පුවරුවක්... ඔබට හිතාගන්න පුලුවන් නේද ? හෝම්ස් පැහැදිලි කළේය.

එය තේරුම් ගත් මා හිස සැලුවෙමි.

එහෙනම් වොට්සන් සවස හමුවෙමු... රෝගීන් ඔබ එනතෙක් මගබලාගෙන ඇති... හෝම්ස් මාගේ පිටට තට්ටුවක් දමමින් කීවේය.

වීරියෙන් කරත්තයක් කුලියට ගත් මා ඩිස්පෙන්සරියට යෑමට පටන් ගත්තෙමි.

හෝම්ස් මෙය කෙලෙස විසඳාවිද යන්න මාගේ සිතේ කිසිඳු ආකාරයක උපකල්පනයක් ඇතිවී නොතිබිණ.

සැබෑවටම වොරන් සාමි සහ හෝම්ස් මේ සිදුකරන්නට යන්නේ කුමක්ද ?

මේ සිදුකරන්නාවූ දෙයින් ජැක් රෝවර් හට නැවතත් සාමාන්‍ය ජීවිතයක් ළඟාකරගත හැකිවේවිද?

sinhalaebooks.com



එලෙසම මොවුන් කියන්නාවූ ආත්මයට කුමක් සිදුවේද?

මෙවැනි ගැටලු රාශියක් මගේ සිතේ උත්පන්නව තිබුණි.

සවස ඩිස්පෙන්සරිය වසා මා ඉක්මනින්ම බේකර් වීථිය කරා ගියේ හෝම්ස්ගෙන් මේ ගැටලුවේ ඉදිරිය ගැන හාරා විමසීමේ අටියෙනි. මා එහි යනවිට හෝම්ස් කුරුසියක් සහිත මාලයක් අතපත ගාමින් සිටියේය.

කුරුස මාලයක්..? මා ඇසුවෙමි.

ඔව්... මින් ඉදිරියට අපට ගොඩාක් දේවල් සිද්ධ වෙයි වොට්සන්... මේක දාගන්න... ඔහු එය මා අත තැබුවේය.

එතකොට ඔබට...

එවිට හෝම්ස් කබා කොලරය මැත් කොට ඔහු දැනටමත් එවැන්නක් පළඳවා සිටින බව පෙන්වීය.

හෝම්ස්... කවද්ද සිල්වියා මහත්මිය මුණගැසීමට යන්නේ...

හෙට... වොට්සන්... ඊට කළින් අපි පොඩ්ඩක් නගර උද්‍යානයේ ඇවිදල එමුද?

මා ඊට එකඟ විය. වීථිය දිගේ අප දෙදෙනාම පිය නැගුවේ ලන්ඩන් නගරයේ මැදට වෙන්නට පිහිටා තිබෙන උද්‍යානයටයි.

ඔබ දන්නවනෙ වොට්සන්... අමනුෂ්‍යා උදවියට අපට වඩා හුඟක් දේවල් කරන්න පුලුවන්...

ඔව්... ඒක ඇත්ත... පුදුම බලවේග...

අන්න හරි... පුදුම හිතෙන දේවල් තමයි ඔවුන් කරන්නෙ...

ඔබ කියන්න හදන්නේ මොකක්ද ?

බලන්න වොට්සන් අර කොලුගැටයා දිහා...

හෝම්ස් තරමක් උසැති තරුණයෙක් පෙන්වා කීවේය.

ඉතිං...

ඔබ දන්නවද ඔහු කවුද කියලා..?

ම්ම්ම්ම්... මීට කළින් දැකලම නෑ...

සත්‍යවශයෙන්ම මා මින් පෙර ඔහුව දැක නොතිබිණි.

අඳුරගන්න වොට්සන් ඔහුව... ජැක් රෝවර් !

මොනවා..?

මගේ මුඛය විවෘත වූයේ මටත් නොදැනිමය.

ජැක් රෝවර්... මා තිගැස්සුනෙමි.

බලන්න ඔබට ඔහුව අඳුනගන්න පුලුවන්ද කියලා... හෝම්ස් ඔහු දෙසට යමින් ඇසුවෙමි.

ඔහුගේ මුහුණ මා පැහැදිලිවම දුටුවේ එවිටය. එදා රෝවර් මහතාගේ නිවසේ තිබූ ඡායාරූපයට බොහෝ සෙයින් එය සමාන විය.

sinhalaebooks.com



නිසැකයෙන්ම හෝම්ස්... ඒ ඔහු තමයි... බලන්න ඔහුගේ උපැස් යුවළ... ඉන්න මං කතා කරන්නම්... එසේ කී මා කට අරින්නට සූදානම් වූවා පමණි, හෝම්ස් ඔහුගේ දෑතින් එය වැලැක්වූයේය.

වොට්සන්... ඒ ජැක් රෝවර් නෙවෙයි... ඔහු හතරබීරි කතාවක් කීවේය.

මොකද නැත්තෙ හෝම්ස්... ඒ ඔහු තමයි... අනිවාර්යයෙන්ම ඒ ජැක්... පේන්නේ නැද්ද ? අනික ඔබමනේද මට ඔහු පෙන්වූයේ...

මා කීවෙමි.

ඒ අපි නාඳුනන මනුස්සයෙක්... ඔහු කීවේය.

මොකක්... දෙයියනේ හෝම්ස් අපිත් අර රෝවර් මහත්මයත් හොයාගන්න දඟලන මනුස්සයා අතන... ඔබ මෙතන මොකක්ද මේ කියවන්නේ... මා කීවේ කලබලයෙනි.

නෑ වොට්සන්... ඒක දෘෂ්ටි මායාවක්... ගණන් ගන්න එපා... ඒ අපිට ජැක් රෝවර් වගේ පේන්නෙ වෙන අයෙක්...

මොනවා...!

ඔව්... ඔබත් මමත් වීජා පුවරුවත් ඒ මායාවට හසුවෙලා ඉන්නේ... හෝම්ස් කීවේය.

ඒත් හෝම්ස්... ඔබ කොහොමද කියන්නෙ ඒ ඉන්නෙ හැබෑ ජැක් රෝවර් නෙවෙයි කියලා... මා ඇසුවෙමි.

මං මේ දවස්වල ක්‍රියාත්මක කරන්නේ වොරන් උපදෙස්...

ඒ කියන්නෙ වොරන් සාමිගේ...

ඔව්... ඔබට සැක නම් අපි යමු... ඔබ කියන ජැක් රෝවර් අසලට... හෝම්ස් පෙරමුණ ගත්තේය.

අප දෙදෙනා ඔහු සිටින දිශාවට ඇවිද ගියෙමු. මා හට පුළුල් විශ්වාසයක් ඒ ජැක් රෝවර් යන්න ගොඩනැගී තිබුණි. දෑසින් දකිනා දෙය අවිශ්වාස කරන්නේ කවරකුද?

බලන්න වොට්සන් එහෙනම්... එසේ කී හෝම්ස් අපට පිටුපා සිටි ජැක් රෝවර් හට කථාකළේය.

මහත්මයා...

එය ඇසූ ජැක් රෝවර් පසුපස හැරී අප දෙස බැලුවේය. පුදුමයකි, ඒ සිටියේ ජැක් රෝවර් නොවේ. අප ඇතින් දුටු පුද්ගලයා ද මොහුමය. පුදුමයට කරුණ නම් අප ඈතින් දුටු උපැස් යුවළ ද අතුරුදන්ය.

සමාවෙන්න... එසේ කී හෝම්ස් මා සමඟ ආපසු යන්නට හැරුණි.

දැක්ක නේද වොට්සන්... මේ ලෝකෙ ඇසින් දැක්ක දේත් අවිශ්වාස කරන්න පුලුවන් දේවල් තියෙනවා... කවදාවත් එක ඉන්ද්‍රියකින් නිගමනයකට එළඹෙන්න එපා... අනිත් ඒවත් පාවිච්චි කරල සංසන්දනය කරන්න... තව හතරක්ම තියෙනවා නොවැ... හෝම්ස් කීවේ ඔහුගේ හිස්වැස්ම නැවත පළඳමිනි.

පසුදින දක්වා මා ලැගුම් ගත්තේ හෝම්ස්ගේ නවාතැනෙහිමය. ඒ මන්ද යත් පසුදිනයේ සිල්වියා මහත්මිය දැකබලා ගැනීමට යෑමේ අටියෙනි. හෝම්ස් හා මම උදෑසනක් දහයට පමණ විම්බල්ඩන් මානසික රෝහල කරා ගියේ ඒ අරමුණ හිතැතිවය.

හෝම්ස්, ඔබ හිතන්නෙ මේ ගමනින් ඵලක් තියේවි කියලද? මා ඇසුවේ මානසික රෝගියෙක්ගෙන් කට උත්තර ලබාගැනීමට යන හෝම්ස් දෙස බලමිනි.

වොට්සන්... මං හිතන්නෙ අපි මේක පරික්ෂා කර බැලිය යුතුයි. බලන්න ඔබ ඊයේ මට හුඟක් හෝඩුවාවන් ලබාදුන්නා... ඒ ගැන කල්පනා කරන කොට නම්... ඔහුට ඉතිරිය සම්පූර්ණ කිරීමට මා ඉඩ නොදුන්නෙමි.

sinhalaebooks.com



මොකක්... මා හෝඩුවාවන් ලබාදුන්නා...?

මා වික්ෂිප්තව වීම පුදුමයට කරුණක් නොවේ.

ඔබ ඊයේ රෑ නිදාගත්තට වොට්සන් අපේ පස්සෙන් එන ආත්මය අපව අතාරින්නේ නෑ... ඔහු මා එක්ක කතාකලා ඔබ යොදාගෙන... ඔහු කීවේ මා පුදුමයට පත්කරමිනි.

හැබැට... ඔහු මොනවද කිව්වෙ මගේ කටින්...

වචන දෙකයි කිව්වේ...

මොනවා... ඒ මොනාද?

Kill You ! හෝම්ස් කීවේය.

* * * * *

රෝහලේ හෙදියක් විසින් අප සිල්වියා රොලින් අසලට කැඳවාගෙන යන ලදි.

තරමක් කුඩා සුදු තීන්ත තැවරූ කාමරයක් මැද ඈ පුටුවක වාඩිවී සිටියාය.

හරි පුදුමයි... මොකද ඇයට විලංගු යොදා නැත්තේ... ඇයට එතරම් අමාරුවක් නැද්ද ?

මා හෙදියගෙන් විමසුවෙමි.

නැහැ ඩොක්ට වොට්සන්... මැයට කිසිම දෙයක් හඳුනාගන්න බැහැ... පංචේන්ද්‍රියන්ගේ සංවේදන මොළයට නොයන රෝගී තත්වයක් තියෙන්නේ... පසුපසින් පැමිණි රෝහලේ වෛද්‍යවරියක් පැවසුවාය.

ඒ කියන්නෙ මැයට හුහක් අසාධ්‍යයි..? එසේ අසමින් මා හෝම්ස් දෙස බැලුවෙමි.

ඔව් වොට්සන් මහත්මයා... ඇයට ඒ සමඟ ඩෙලේරියම් ( Delirium) තත්වය අනුගත වෙලා තියෙන්නෙ. ඇය කීවාය.

ඔහ් ජේසුනි..! මට කියැවිණ.

මැයට යමක් පෙන්වීමට ඔබලාගෙන් බාධාවක් නැතිද මහත්මිය. හෝම්ස් එම වෛද්‍යවරියගෙන් විමසීය.

ගැටලුවක් නැහැ හෝම්ස් මහත්මයා... ඒත් දෑස්වල දෘෂ්ටිය හොඳට තිබුණට මොකද මැයට කිසිවක් හඳුනාගන්න බැහැ... කොටින්ම ඇයට කතා කරන්නත් බැහැ ඇය තවදුරටත් කීවාය.

ඔව් හෝම්ස්... ඒකෙන් වැඩක් වෙන්නේ නැහැ... ඔබ මොකක්ද පෙන්වන්න යන්නේ... මා ඇසුවෙමි.

හෝම්ස් කිසිත් නොකියාම කබා සාක්කුවෙන් නමා තිබූ කඩදාසියක් රැගෙන එය දිගහැර අපට නොපෙන්වාම සිල්වියා හට පෙන්වූයේ තත්පර දෙකක්වත් ගතවීමට පෙරය.

ඊළඟ මොහොතේ සිදුවූයේ සිහිනෙකින්වත් නොසිතූවකි.

සිල්වියා රොලින් යටිගිරියෙන් කෑගසා විලාප දුන්නේ කඩදාසිය මත තිබූ දෙය දැකීමෙනි.

මා මෙන්ම වෛද්‍යවරියටද මේ කිසිවක් සිතාගැනීමට නොහැකිව ඇසිපිය ගැසුවෙමු.

හෝම්ස් කඩදාසිය දිගහැරගෙනම අප වෙත හැරුණේ එය අපටද පෙන්වීමටයි.

තද කළු තීන්තයෙන් 'Goodbye' යන්න එහි පැහැදිලිව ලියා තිබුණේය.

එය දුටු මානසික රෝග විශේෂඥවරිය ක්ලාන්ත වී මගේ දෙඅත් උඩට කඩාගෙන වැටුනේ බිමට වැටීමට තිබූ සියයට අනූනවයක සම්භාවිතාව බිඳහෙළමිනි.

sinhalaebooks.com



සැනෙකින් මා ඇය ග්‍රහණය කරගත්තෙමි.

සිල්වියා රොලින් මහත්මිය හඬගාගෙනම බිම ඇදවැටුණේ ඒ මොහොතේමය.

හෙදියකවිත් වෛද්‍යවරිය රැගෙන ගිය අතර තවත් හෙදියන් කිහිප දෙනෙකු විත් රොලින් මහත්මිය හදිසි ප්‍රතිකාර අංශයට රැගෙන ගියහ.

හෝම්ස් සමඟ මම රෝහලේ පහත මාලයට බැස්සේ කිසිවක් සිතාගත නොහැකිවය.

හෝම්ස් මට මේ කිසිදෙයක් තේරුම් ගන්න බෑ... ඇත්තටම කොහොමද එහෙම දෙයක් සිද්ධ වුණේ...

ඒක තමයි වොට්සන් මේ කාරණාවේ තියෙන සුවිශේෂත්වය... වෛද්‍යවරු රෝගියාට සොයන්නේ භෞතික පිළියමක් විතරයි... අනිත් එක ඔවුන් ඒ භෞතික රාමුවෙන් පිටතට යන්නේ නෑ...

ඔව් ඉතිං වෛද්‍ය විද්‍යාවේ අභෞතික ප්‍රතිකාර නැහැ නොවැ... මා කීවෙමි.

ඉතිං වොට්සන් රොලින් මහත්මිය සිටි තත්වයෙන් මොහොතකට එළියට ගන්න මට පුලුවන් වුණා... හෝම්ස් කීවේ පියගැටපෙළ එක් පඩියක නැවතෙමිනි.

ඔබ කියන්නෙ, ඇය සිටි මානසික ව්‍යාකූලත්වයෙන් මොහොතකට මුදවා ගත්තා කියලද ...? මාද නැවතී විමසුවෙමි.

ඔව් ඒත් ඒ මානසික ව්‍යාකූලත්වයක් නෙවෙයි... හෝම්ස් කීවේය.

එහෙනම්...

ආත්මීය ව්‍යාකූලත්වය... ඒක තමයි ගැළපෙනම වචනය... මොකද මෙතන තියෙන්නේ ආත්මයක් පැහැරගැනීමේ ගැටලුවක්... ජැක් රෝවර්ගේ ආත්මය අපි හොයන යක්ෂයා පැහැරගත්තා... ඔහු වීජා පුවරුව ඒකට යොදාගත්තා... පැහැදිලි ද වොට්සන්...

හෝම්ස් එය කියනවාත් සමඟම අප සිටි තරමක් උස පඩියෙන් පය ලිස්සී හෝම්ස් ඇදගෙන වැටිණි.
මා වහා ක්‍රියාත්මක වී ඔහු අල්ලාගත්තෙමි. නමුත් එහි හෝම්ස් සිටියේ නැත සැබැවින්ම වැටුණේ මාය.
හෝම්ස් යාර කිහිපයක දුරින් තිබූ ඉහළ පඩියක සිට පහළට බැස ආවේය.

වොට්සන්... ඔබට තුවාලද ? ගැටලුවක් නැහැනේ... හෝම්ස් ඇසුවේය.

නැහැ...
මා කීවෙමි.

හෝම්ස් මා නැගිටුවා බිම වැටී තිබූ මාගේ හිස්වැස්ම රැගෙන දුන්නේය.

මොකක්ද හෝම්ස් මෙතන වුණේ...

අප දෙදෙනා කතාකරමින් ආවා... මා එක් පඩියක නැවතුනා... ඒත් ඔබ දිගටම කතාකරමින් පහළට ගියා... එක්වරම ඔබ සිටි පඩිය ලිස්සී ඔබ ඇදවැටුණා... හෝම්ස් කීවේ මා පුදුමයට පත් කරමිනි.

මොනවා... ඒත් ඔබ මා සමඟ කතා කරමින් ආවානේ...?

sinhalaebooks.com



මං අන්තිමට නැවතිලා ඔබට කිව්වේ ඒ මානසික ව්‍යාකූලත්වයක් නෙවෙයි කියලා... හෝම්ස් කීවේය.

නැහැ හෝම්ස්... ඇයි ඔබ කිව්වේ ඒකට හරිම වචනය ආත්මීය ව්‍යාකූලත්වය කියලා... තව මෙතන තියෙන්නෙ ආත්ම පැහැරගැනීමේ ගැටලුවක් කියලත් කිව්වා... මා කීවෙමි.

තව මොනවද කිව්වේ?

ම්ම්ම්...ජැක් රෝවර්ගේ ආත්මය පැහැරගන්න, යක්ෂයා වීජා පුවරුව යොදාගත්තා කියලත් කිව්වා... මා ඔහු පෙර කී සියල්ල කීවෙමි.

ඔබ හිතන්නේ මා ඔබට ඒවා කිව්වා කියලද?... නැහැ වොට්සන්.... ඇත්තටම ඒ මං ඔබට කියන්නට කල්පනා කරමින් හිටි දෙය...

හෝම්ස් කීවේ මා තැතිගන්වමිනි.

හෝම්ස් මෙවැන්නක් නම් කිසිදිනක සිදුවෙලා නෑ... මා කීවේ නවාතැනට ආපසු පැමිණීමෙන් අනතුරුව ය.

ඔව් වොට්සන් මටත් එවැන්නක් කවදාවත් සිද්ධ වෙලා නැහැ... හෝම්ස් කීවේ හඩ්සන් මහත්මිය සාදා දුන් බාර්ලි කෝප්පයේ රස බලමිනි.

ඔව් ඔබ ඒ වගේ අත්දැකීමක් ලබල නැතුව ඇති මින් පෙර...

නෑ වොට්සන් මං කිව්වෙ පඩිපෙළේ සිද්ධ වුණු දේ ගැන නෙවෙයි...

එහෙනම්... මා ඇසුවෙමි.

රොලින් මහත්මියට සිද්ධ වෙච්චි දේ ගැන...

ඔහ් දෙවියනේ... මට ඒ ගැන අමතකම වෙලා ගියා හෝම්ස්... ඇත්තටම කොහොමද මට ඒක අමතක වුණේ... රොලින් මහත්මිය සිටියේ සිත මියගිය අයෙක් ලෙස... නමුත්...

නමුත් Goodbye වචනයෙන් ඇය නැවත ඇහැරුනා... හෝම්ස් කීවේය.

ඔබ කියන්නෙ මේ දෙයින් අපට මේ යක්ෂයා මෙල්ල කරගන්න යමක් කළහැකිවේවිද?...

ඒක අහමු අපි ඔහුගෙන්... කී හෝම්ස් දොර දෙසට අත දිගුලේය.

පඩිපෙළ නැගමින් ආ උස තරමක් මැදිවියේ යැයි කිව හැකි මිනිසෙක් සැනෙකින් අප ඉදිරියේ විය.

සුබ සන්ධ්‍යාවක් මහත්වරුණි...

සුබ සන්ධ්‍යාවක් වොරන් මහත්මයා... හෝම්ස් හා මම ඔහුට ආචාර කළෙමි.

ඒ පැමිණ සිටියේ වොරන් සාමිවරයාය. නිවැරදිවම කිවහොත් මහාචාර්ය වොරන් ය.

හෝම්ස් ඉතාම පැහැදිලිව නිරවුල්ව සිදුවූ සියල්ල ඔහුට පැහැදිලි කළේය.

හොඳයි හෝම්ස් මහත්මයා... මේකෙන් කියන්නෙ යක්ෂයා ඇයට ප්‍රතිචාර දක්වනවා කියන එක... වොරන් සාමි පැහැදිලි කළේය.

ඔව්... පැහැදිලිවම... ඇයට ඒ වචනයට ප්‍රතිචාර දක්වන්න ගියේ බොහොම කුඩා වෙලාවක්... හෝම්ස් කීය.

sinhalaebooks.com



දැන් හෝම්ස් මහත්මයා ඊළඟ පියවර මම කිව්ව විදියටම කරන්න... වොරන් සාමිවරයා රහසින් මෙන් කීවේ හෝම්ස්ගේත් මගේත් මුහුණු දෙස වරින්වර බලමිනි.

හොඳයි... හෝම්ස් ඔහුට පිළිතුරු දිනි.

සැබැවින්ම වොරන් සාමි සිතාසිටියේ මාද හෝම්ස් මෙන් ඔහුගේ ඉදිරි සැලැස්ම දන්නා බවය. නමුත් ඒ කිසිවක් මා නොදැන සිටියේ හෝම්ස් ඒ පිළිබඳව මා දැනුවත් නොකළ බැවිනි.

මොහොතකින් වොරන් සාමි පිටව ගියේය. එනමුත් ඔහු කී කිසිවක් මට සවන් නොවැකුණේ වොරන් සාමි නැගිට හෝම්ස් සමඟ පිටතට ගිය නිසාය.

නමුත් ඔහු පිටව ගිය සැනින් මේ පිළිබඳව හෝම්ස්ගෙන් ඇසීමට මා අමතක නොකළේය.

මොකක්ද ඒ ඉදිරි සැලැස්ම... ?

අනිවාර්යයෙන්ම වොට්සන් ඒක ඔබ දැනගන්නම ඕනි... අපිට අද රෑට විම්බල්ඩන් රෝහලට යන්න වෙනවා...

මොනවා... ඒ මොකටද ? රොලින් මහත්මිය හමුවුණා නේද?

ඔව් ඒක ඇත්ත... ඒත් මං ඒ කලේ පරීක්ෂණයක්... හෝම්ස් කීය.

හැබැට... ඒ මොකක්ද ?

ඇය යක්ෂයාට ප්‍රතිචාර දක්වනවා... එහෙනම් ඇය ලව්වා යක්ෂයා ගෙන්වන්න පුලුවන්...

ඉතිං රෑට මොකක්ද කරන්න යන්නේ...

පැහැදිලිවම කිව්වොත් වොට්සන්... අපි යන්නෙ ඈ පැහැරගන්න... හෝම්ස් කීවේ දෙවුර සලමිනි.

මොකක්... ඇය පැහැරගන්න..? මා විමතියට පත්වීම පුදුමයට කරුණක් නොවේ.

එහෙම නැත්තං වොට්සන් ඔබට පුලුවන් රෝහල් කාර්යමණ්ඩලය දැනුවත් කරලා ඇයව මේ කාර්යය සඳහා රැගෙන එන්න... හෝම්ස් කීවේ ඇඟටපතට නොදැනීමය.

හෝම්ස්... හරි ඔබ කියනවා වගේ අපි ඈ රැගෙන ආවා කියමු... යක්ෂයාත් ගෙන්නුවා කියමු... ඒත් ඇයට ඊළඟට මොකද වෙන්නේ... මා ඇසිමි.

මිත්‍රයා... දුරබැලීම පිළිබඳව ඔබට බොහොම ස්තූතියි... ඉඩක් තිබුණොත් ඇයව නැවතත් මානසික රෝහලට රැගෙන යාමට අපට පුලුවන් වෙයි... ඔහු කීවේය.

ඔබ මගේ වචන අහක දානවා... මම කණස්සල්ලට පත්වී කීවෙමි.

ඔහු අසුනින් නැගිට්ටේය.

වොට්සන්... මං කවදාවත් ඔබේ වචන අහකදාලා නෑ... නමුත් මේආකාර අභෞතික, සාමාන්‍ය මනුස්සයෙක්ට අසම්භාව්‍ය කරුණකට අපිට මේ වගේ අවධානමක් ගන්නම වෙනවා... ඔහු කීවේ දෙඅත් දෙපසට දිගුකරමින්ය.

හොඳයි... ඔබට කැමති දෙයක් කරන්න... මා කීවෙමි.

නෑ වොට්සන්, මට කැමති දේ අපි කරමු. ඔහු කීවේ සිනාසෙමිනි.

ආත්මාර්ථකාමියා !

මා ඔහුට සරදම් කළෙමි.

sinhalaebooks.com



සවස් යාමය කෙමෙන් කෙමෙන් ගෙවීගියේ විම්බල්ඩන් රෝහලට නැවත යෑමේ මොහොත උදාකරමිනි.

වොට්සන් සිල්වර් මංසන්ධිය අසලට වොරන් සාමි ඒවි. අපි යමු... ආ... අමතක කරන්න එපා...

රිවෝල්වරය... මා කීවේ ඔහු එය කීමටත් පෙරය.

ඔව්... අනිවාර්යයෙන්ම... ඔබේ නිගමනයකට එළඹීමේ වේගය ගැන නම් මට ඉතාමත් සතුටුයි... ඔහු මට ප්‍රශංසා කළේය.

ස්තුතියි හෝම්ස්... මා කීවෙමි.

අප දෙදෙනා එලෙසින් පිටත් වූයේ වොරන් සාමි එන්නේ යැයි කිවූ සිල්වර් මංසන්ධියටය.

නමුත් වොරන් සාමි එහි පැමිණ සිටියේ නැත.

වොට්සන්... දැන් අපි මෙතන ගොඩක් වෙලා බලාහිටිය නොවැ... අපි යමු... හෝම්ස් කීවේය.

ඔබ කැමති දේ නේ අපි කරන්නේ... ඉතිං එහෙනම් යමු... මා කීවේය.

එලෙසින් අපි අශ්ව කරත්තයක් රැගෙන විම්බල්ඩන් රෝහල කරා පැමිණියෙමු. රෝහලට යාබද මාවත අසල හෝම්ස් අසරුවා නැවත්වූයේය.

එය පිටත් කර යැවූ හෝම්ස් මා සමඟ රෝහල පෙනෙන මානයට පැමිණියෙමු.

පෙනෙන නොපෙනන ඈතින් මිනිසෙක් අප කරා පැමිණියේය. ඒ අනෙකකු නොව වොරන් සාමිය.

හෝම්ස්... ඔහු ආවේ කලබලයෙනි.

හෝම්ස්... ඇය අතුරුදන් වෙලා... සිල්වියා රොලින්... ඇය රෝහලේ නැහැ... වොරන් කීවේය.

ඒක මම දන්නවා මහත්මයා...

මොනවා ඔබ දැන සිටියාද ඇය රෝහලේ නැති විත්තිය...

වොරන් සාමි මාගේ මුහුණ දෙස බැලුවේ කිසිවක් කරකියාගත නොහැකිවය.

හැබැට හෝම්ස් ඔබට ලෙඩක්වත් හැදීගෙන එනවද? මා කේන්තියෙන් විමසුවේ සිල්වියා නැතිබව දැන දැනම විම්බල්ඩන් රෝහලට ආ නිසාය.

වොට්සන්... ඒ ඔබ දුටු දේ... ඒ ඔබ ඇසූ දේ...

මිත්‍රයා මෙතන ඉන්නේ වොරන් සාමි නෙවෙයි.

වො..වොරන් සාමි නෙවෙයි...

මට ගොතගැසුණි. නමුත් ඒ සිටින්නේ වොරන් සාමිය. හෝම්ස් හට මෙවර නම් වැරදීගොස්ය.

සුබ දවසක් ග්‍රෙග්සන්... හෝම්ස් එසේ කීවේ වොරන් සාමිටය.

නමුත් වොරන් සාමි එයට පිළිවදන් දුන්නේය.

සුභ දවසක් හෝම්ස් මහත්මයා... මොකද මේ වොට්සන් මහත්මයාට මාව අඳුරගන්න බැරි... හෙලෝ ඩොක්ටර් වොට්සන්... ඔහු කීවේය.

මට තරු විසිවුණි. මා මින් පෙර දෘෂ්ටි මායාවකට හසුවූවා සේ දැන් ද එය සිදුවී තිබෙන බව මා වටහා ගත්තෙමි.

sinhalaebooks.com



එවිටම ඒ සිටින්නේ ග්‍රෙග්සන් බව මට හඳුනා ගන්නට හැකිවිණ.

ඔබ කලින් මොනවද කීවේ... මා ග්‍රෙග්සන්ගෙන් විමසුවෙමි.

මහත්මයා මා දැන් ආවා පමණයි නේ... ඔහු කීවේය.

මට සියල්ල පැහැදිලි විය. කලින් වතාවේදී රෝහලේ පියගැටපෙලේදී සිදුවූ දෙය පාඨක ඔබට මතක ඇතැයි සිතමි.

එහිදී හෝම්ස් කියන්නට සිටි දෙය මට කළින්ම ඇසිනි. මෙවරද එය එසේ වී ඇති බව සහතිකය.

ග්‍රෙග්සන් ඔබ ආවේ මේ රෝහලේ සිල්වියා රොලින් නැමැත්තිය අතුරුදන් බව කියන්නනේ...

එතකොට හෝම්ස්, ඔබ දන්නවනේ ඇය නැතිවෙලා කියලා... මා වීරයකු මෙන් කීය.

ග්‍රෙග්සන් ගල්ගැසී බලාසිටි අයුරු මට අදටත් සිහිවේ.

ඔබ නිවැරදියි !

හෝම්ස් ඉතාම නිහතමානී අයුරින් කීවේය.

මහත්මයා ඔබ කොහොමද ඒක දන්නේ... ග්‍රෙග්සන් ඇසීය. ඔහු එවැන්නක් මාගෙන් විමසීම සර්ව සාධාරණය.

දෘෂ්ටි මායාව... ඔව් ඒක තමයි හරිම වචනය...

මා කීවෙමි.

වොට්සන්, අපි යමු ඩර්හැම් විශ්වවිද්‍යාලය භූමියට... වොරන් සාමි අප එනකල් බලාගෙන ඇති... නිකම්ම නෙවෙයි, යක්ෂයා ගෙන්වන යතුර අතැතිව... කනගාටුයි ග්‍රෙග්සන් ඔබේ ගැටලුවට මට අද සහභාගි වෙන්න විදියක් නෑ...

හෝම්ස් කීවේ ග්‍රෙග්සන්ට සමුදී ආපසු හැරෙමිනි.

ග්‍රෙග්සන් කිසිවක් නොකියා බලාසිටියේ, ගැටලුව කුමක්ද යැයි ඉදිරිපත් කිරීමට ප්‍රථම එයට පිළිතුරු ලැබුණු නිසාවෙන් වියයුතුය.

අප දෙදෙනා ඉක්මනින් පැමිණියේ ඩර්හැම් විශ්වවිද්‍යාලයටයි. එහි මානව ශාස්ත්‍ර පීඨයට යාබද ගොඩනැගිල්ල වෙත ගිය හෝම්ස් මාහටද එයට ඇරයුම් කළේය.

එහි ඇතුලට ගිය අපට දැක ගැනීමට හැකිවූයේ සිල්වියා මහත්මිය පුටුවක ගැටගසා තිබෙන අයුරුයි.

එම මුළු කාමරයටම එකම එක ලාම්පුවක් දල්වා තිබුණු අතර සිල්වියා මහත්මිය අසලම එය තබා තිබුණි.

එහෙනම් වොට්සන්... දැන් වෙලාව රෑ 10යි. අපිට කලින් ඔහු වැඩේ සකස් කරලා... අපි ඒක පටන්ගමු.

ඔහු..? මා ඇසුවෙමි.

මහත්වරුණි, සමාවෙන්න කළින් මේ ගැන දැනුවත් කරන්න නොහැකි වුණාට... වොරන් සාමි පසුපස දොරින් පැමිණෙමින් කීය.

මෙන්න හෝම්ස් මහත්මයා...

ඔහු හෝම්ස්ට ලබා දුන්නේ ශුද්ධ වූ බයිබලයයි.

වොට්සන් මහත්මයා... මෙන්න ඔබටත්...

වොරන් සාමි කී පිටුවේ ඇති ශුද්ධ වැකි එකින් එක කියමින් ටික වේලාවක් ගතවිය.

sinhalaebooks.com



එක්වරම රොලින් මහත්මිය යටිගිරියෙන් කෑගැසුවේ අප භීතියට පත්කරමිනි.

ඇය විටින් විට එය පමණක් සිදුකළ අතර මා හට එහිදී තේරුම් ගිය එක් කාරණයක් වන්නේ ඇයගේ කටහඬ වෙනස් වී යාමයි.

එක්වරම ඇයගේ පරිවර්තිත කටහඬින් මෙසේ ඇමතීය.

උඹලට ඕනි මරණය, උඹලට ඕනි මරණය...

නෑ, මට ඕනි උඹේ ආත්මය... දැන්මම... හෝම්ස් කීවේය.

රොලින් මහත්මිය උමතුවෙන් මෙන් සිනාසුනි.

දැන් ඒ සිටින්නේ රොලින් මහත්මිය නොව යක්ෂයා බව මට තේරුම් ගියේ එවිටය.

නැත්නම් උඹට කරන දේ බලාගනින්

වොරන් සාමි කීය.

එසේ කී ඔහු සියල්ලට මුල් වූ වීජා පුවරුව අතට ගත්තේය.

උඹලට මොනවද ඕන... උඹලට මොනවද ඕන..."

යක්ෂයා විමසීය.

උඹේ ආත්මය...

එසේ කී හෝම්ස් වීජා පුවරුව රැගෙන එය දෙකට කැඩීමට දණහිස එසවූයේය.

මට දීපන් මේ ගෑනිව... ඒවෙනුවට... යක්ෂයා කීවේය.

එනම් යක්ෂයා මේ කියන්නේ රොලින් මහත්මියගේ ආත්මය ඔහුට අවශ්‍ය බවයි.

මා පුදුමයට පත් කරමින් හෝම්ස් එයට එකඟ විය.

උඹට දෙන්නෙ එක විනාඩියයි... වොරන් සාමි කීය.

විනාඩියක් පමණ ගතවිය.

නමුත් එක්වරම ලාම්පුව නිවීගියේ අප සියලු දෙනා අන්ධකාරයට ඇදදමමිනි.

කළබල වෙන්න එපා... හෝම්ස් කීය.

තත්පර කිහිපයකින් නැවත දැල්වුණු ලාම්පු එළියෙන් මා දුටුවේ ඇස් අදහාගත නොහැකි දර්ශනයකි.

එනම් රොලින් මහත්මිය සිටි පුටුවට පසුපසින් ජැක් රෝවර් සිටගෙන සිටියේය.

ජැක්... හෝම්ස්, ඔහු පැමිණිලා...

මා කීවෙමි.

වොරන්... පොරව දෙන්න...

හෝම්ස් කෑගැසීය.

එසැනින් ක්‍රියාත්මක වූ වොරන් සාමි පොරව හෝම්ස් අතට දුන්නේ ඔහු අත තිබූ වීජා පුවරුව බිම තබමිනි.

sinhalaebooks.com



මේ කුමක් සිදුවන්නේද ? යන ප්‍රශ්නාර්ථය සහිතව සිදුවන දේ මා බලා සිටියා පමණි.

පොරව අතට ගත් හෝම්ස්, එය ඔසවා වැරෙන් පහරක් දුන්නේ, වීජා පුවරුවේ කැබලි දසත විසුරුවමිනි.

එය කැබලිවලට පරිවර්තනය වන ක්ෂණයේ ජැක් හා සිල්වියා රොලින්ගේ සිහි නැතිව ඇද වැටිණ. එහිදී මාහටද කිරීමට කාරියක් ඉතුරු වූයේ එලෙසිනි.

❀ ❀ ❀ ❀

හෝම්ස් උදෑසන දහයට පමණ නැවත නවාතැනට ආවේ රෝහලට ගොසිනි.

ජැක් රෝවර් රෝහලින් පිටවගියා... ඔහුට කියන්න තරම් අමාරුවක් නෑ...

හෝම්ස් එසේ කියමින් සෝෆාවේ හාන්සිවිය.

රොලින් මහත්මියට දැන් කොහොමද හෝම්ස්...

වරදක් නෑ ඇය හොඳින්, ඩෙලේරියම් තත්වයත් සුවවෙලා නොවැ.... හෝම්ස් කීවේ ඔච්චමට සිනා සෙමිනි.

ඕ... හෝම්ස්... වෛද්‍ය වෘත්තියට නිගරු කරන්න එපා... ඔබමනේද කිව්වෙ ඔවුන් ඉගෙන ගෙන තිබෙන්නෙ භෞතික තත්වයන් යටතේ විතරයි කියලා...

මා කීවේ කණස්සල්ලෙනි.

මං පිළිගන්නවා වොට්සන්, ඉතාම නිහතමානීව... ඔව් ඉතාමත් නිහතමානීව...

හෝම්ස් එයද කීවේ සරදමටය.

යක්ෂයෙක් පරදපු පළියට ඔබට ලෙඩ නොවී තිබෙන්නේ නැහැ නොවැ... මා කීවෙමි.

ඔව්... ඇත්ත !

හෝම්ස් කීවේය.

හැබැට හෝම්ස්... වොරන් සාමිද කිව්වේ, වීජා පුවරුව විනාශකෙරුවම යක්ෂයාගෙන් ආත්ම ගලවාගන්න පුලුවන් කියලා... මා ඇසුවෙමි.

පැහැදිලිවම වොට්සන්... ඔහු තමයි ඒ ගැන කිව්වේ... හෝම්ස් කීවෙමි.

එතකොට හෝම්ස්, මට අර තිබුණු දෘෂ්ටි මායාව... ඒක ඔබට තිබුණේ නැත්තෙ මොකද ?

ඔබ වෛද්‍යවරයෙක් නේ වොට්සන්...

ඉතිං මොකක්ද තියෙන සම්බන්ධය...

මා ඇසුවෙමි.

ඔබ ඉගෙන ගෙන තියෙන්නෙ භෞතික තත්වයන්ට විතරයි නොවැ !

ඔහු එසේ කීවේ ඇසක් ඉහිමරමිනි.

**නිමි.**

sinhalaebooks.com

